Australian Human Rights Commission
*everyone, everywhere, everyday*

# පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම

ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම (Australian Human Rights Commission) යනු ලිංගිකත්වය, ජාතිය, ආබාධිතබව සහ වයස පදනම්වූ නීතිවිරෝධී වෙනසකට ලක් කිරීම්, (ILO III discrimination) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 111 සම්මුතිය යටතේ කෙරෙන වෙනසකට ලක් කිරීම් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ආදිය විමර්ශනය කරන සහ පැමිණිලි විසඳාලන ස්වාධීන ආයතනයකි.

## කුමක් සම්බන්ධයෙන් අපට පැමිණිලි යොමුකල හැකිද?

- ***ලිංගිකත්වය පදනම් වෙනසකට ලක් කිරීම*** අතරට ලිංගික අතවර, සහ ලිංගිකත්වය, ලිංගික අනන්‍යතාවය, අන්තර් ලිංගික තත්වය, ගර්භනීබව, වෛවාහික හෝ සම්බන්ධතා තත්වය, මව්කිරි ලබාදීම, පවුල් වගකීම් සහ ලිංගික හැඩගැස්ම පදනම්වූ වෙනසකට ලක් කිරීම ඇතුලත්වේ.
- ***ආබාධිතභාවය පදනම් වෙනසකට ලක් කිරීම*** අතරට ශාරීරික, බුද්ධිමය, සංවේදන, ඉගෙනීමේ සහ මනෝචිකිත්සක ආබාධිතබව; රෝග හෝ අසනීප; සෞඛ්‍යය තත්වය; රාජකාරී ආශ්‍රිත අසනීප; අතීත, වර්තමාන, සහ අනාගත ආබධිතභාවයන්; සහ ආබාධිතයන්ගේ සහායකයන්; සතුන් හට උපකාර කිරීම සහ ආබාධිතබව ඇති අයෙකු හා ආශ්‍රිත ආබාධිතබව ඇතුලත්වේ.
- ***ජාතිය පදනම් වෙනසකට ලක් කිරීම*** අතරට ජාතිය, සමෙහි වර්ණය, පෙළපත, ජාතික හෝ වාර්ගික සම්භවය සහ සංක්‍රමණික තත්වය යටතේ කරන වෙනසකට ලක් කිරීම් ඇතුලත්වේ.
- ***වයස පදනම්වූ වෙනසකට ලක් කිරීම*** අතරට වයසින් ඉතා අඩුවීම හෝ වැඩිවීම පදනම්වූ වෙනසකට ලක් කිරීම ඇතුලත්වේ.
- ***ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 111 සම්මුතිය යටතේ කෙරෙන වෙනසකට ලක් කිරීම්*** අතරට ආගම, අපරාධ වාර්තා, වෘත්තීය සමිති ක්‍රියාකාරකම්, දේශපාලන මතවාද සහ සමාජ සම්භවය පදනම්වූ වෙනසකට ලක් කිරීම් ඇතුලත්වේ.
- ***මානව හිමිකම්*** අතරට සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතිය, ළමුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ සම්මුතිය සහ ආබාධිත අයගේ අයිතිවාසිකම් සම්බන්ධ සම්මුතිය වැනි විශේෂිත ජාත්‍යන්තර මානව හිමිකම් ලේඛණ උල්ලංඝණය කිරීම සම්බන්ධ කොමන්වෙල්ත් රජයේ හෝ එය වෙනුවෙන් කරනු ලබන ක්‍රියා ඇතුලත්වේ.

ඔබ ඕස්ට්‍රේලියාවේ කුමන ප්‍රදේශයක සිටියද කිසිදු වියදමක් නොමැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය. පැමිණිලි ක්‍රියාවලියේ පියවර පහත දක්වා ඇත.

## විමසීමක් කිරීම

- යම්කිසි දෙයක් සම්බන්ධයෙන් ඔබට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට හැකිද යන්න පැහැදිලි නැතිනම්, දුරකථන අංක 1300 656 419 ඔස්සෙ කොමිසමේ ජාතික තොරතුරු සේවාව හෝ ඊමේල් infoservice@humanrights.gov.au ඔස්සේ අප හා සම්බන්ධවිය හැකිය.
- ක්‍රියාවලිය ආරම්භ කිරීමට ඔබ වෙත පැමිණිලි කිරීම සම්බන්ධ පෝරමයක් එවිය හැකිය.
- අප විසින් ඔබට උපකාර කල නොහැකිනම්, ඔබට උපකාර කල හැකි වෙනත් අයෙකු වෙත යොමු කිරීමට උත්සාහ දරනු ඇත.

April 2020

## පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම

- පැමිණිල්ලක් ලිඛිත විය යුතුය. ඔබ විසින් පැමිණිලි කිරීම සම්බන්ධ ෆෝරමයක් සම්පූර්ණකර අප වෙත ෆැක්ස් හෝ තැපැල් මගින් එවිය හැකිය. නැතිනම්, අපගේ වෙබ් අඩවිය වන www.humanrights.gov.au වෙත පිවිසීම මගින් මාර්ගගත පැමිණිල්ලක් යොමු කල හැකිය.

- ඔබගේ මනාප භාෂාවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකි අතර ඔබට අවශ්‍ය නම්, ඔබගේ පැමිණිල්ල ලිවීමට අප විසින් උපකාර කල හැකිය.

- පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට නීතීඥවරයෙකුගේ සහාය ඔබට අවශ්‍ය නැත.

- ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් අපට කටයුතු කල නොහැකි නම් එයට හේතුව අප විසින් පැහැදිලි කර දෙනු ඇත.

## විමර්ශනය

- ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අප විසින් ඔබ හා සම්බන්ධවන අතර අප හට වැඩිදුර තොරතුරු ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකිය.

- සාමාන්‍යයෙන්, ඔබ පැමිණිල්ල ඉදිරිපත් කරන පුද්ගලයා හෝ සංවිධානය හට ඔබගේ පැමිණිල්ලේ පිටපතක් ලබාදෙනු ඇත. ඒ සම්බන්ධ විශේෂිත තොරතුරු සහ/හෝ ඔබගේ පැමිණිල්ලට ප්‍රතිචාරයක් ලබාදෙන ලෙස අප විසින් ඉල්ලා සිටිය හැකිය. ඔබගේ පැමිණිල්ලට ප්‍රතිචාර වශයෙන් කොමිසම වෙත ලබාදෙන තොරතුරු අතර ඔබ සම්බන්ධ සංවේදී සහ පුද්ගලික තොරතුරු ඇතුලත් විය හැකිය.

- සමහර අවස්ථාවල ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් දිගටම කටයුතු නොකිරීමට අප තීරණය කල හැකිය. එසේ සිදුවුවහොත් අප ඔබට හේතු පැහැදිලි කර දෙනු ඇත.

- සමථය මගින් ඔබගේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා අප ඔබ සමග සාකච්ඡා කල හැකිය..

## සමථකරණය

- සමථකරණය යනු ඔබ සහ ඔබ විසින් පැමිණිලි කරන පුද්ගලයා හෝ සංවිධානය සමඟ මතභේදය විසඳා ගැනීමට අප විසින් ගනු ලබන උත්සාහයකි.

- සමථකරණය, මුහුණට මුහුණලා පවත්වන රැස්වීමක් හෝ දුරකථන සාකච්ඡාවක් මගින් සිදුවිය හැකිය. සමහර අවස්ථාවල සමථකරු සමඟ කරනු ලබන ඊමේල් හුවමාරුවක් සහ සංවාදයකින් පැමිණිල්ල විසඳාගත හැකිය.

- පැමිණිලි විවිධ ආකාරවලින් විසඳාගත හැකිය. උදාහරණ වශයෙන්, සමාව ගැනීම, ප්‍රතිපත්ති වෙනස් කිරීම හෝ වන්දියක් ලබාදීම.

## අධිකරණ ක්‍රියා මාර්ග සම්බන්ධ හැකියාව - ලිංගය, ආබාධිතබව, ජාතිය සහ වයස පදනම් වෙනසකට ලක් කිරීම්

- නීතිවිරෝධී ආකාරයකට වෙනසකට ලක්වී ඇතිද යන්න තීරණය කිරීමට කොමසාරිස්වරයාට බලය නැත.

- ඔබගේ පැමිණිල්ල කිසියම් හේතුවක් නිසා විසඳුනේ නැතිනම් හෝ දිගටම පවත්වාගෙන නොගියේ නම්, ඔබට එම කරුණ අධිකරණයට ගෙනයා හැකිය. නීතිවිරෝධී ලෙස වෙනසකට ලක්වී ඇතිද යන්න අධිකරණය විසින් තීරණ කල හැකිය.

- කොමිසම විසින් පැමිණිල්ල අවසාන කර දින 60ක් ඇතුලත ඕස්ට්‍රේලියානු ෆෙඩරල් සර්කිට් අධිකරණය හෝ ඕස්ට්‍රේලියානු ෆෙඩරල් අධිකරණය වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල හැකිය.

- ඔබ වෙනුවෙන් කොමිසම විසින් පැමිණිල්ල අධිකරණය වෙත ගෙනයා නොහැකි අතර අධිකරණයේදී ඔබගේ නඩුව ඉදිරිපත් කිරීමද කල නොහැක.

- ඔබට අධිකරණයට යාමට අවශ්‍ය නම්, ඔබ විසින් නීතිඥවරයෙකු හෝ නීති සේවාවක් සමඟ සාකච්ඡා කල යුතුය.

## තීරණය / ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 111 සම්මුතිය යටතේ කෙරෙන වෙනසකට ලක් කිරීම් සම්බන්ධ තීරණ

- වෙනත් හේතුවක් නිසා පැමිණිල්ල විසඳුනේ නැතිනම් හෝ පැමිණිල්ල දිගටම පවත්වාගෙන නොගියේනම්, කොමිසමේ සභාපතිවරයා විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 111 සම්මුතිය යටතේ කෙරෙන වෙනසකට ලක් කිරීමක් සිදුවී ඇතිදැයි තීරණය කල හැකිය.

- සභාපතිවරයා විසින් වෙනසකට ලක්වීමක් හෝ මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුවී ඇතැයි සෑහීමකට පත්වේනම්, සභාපතිවරයා විසින් අදාල කරුණ ෆෙඩරල් නීතිපතිවරයා වෙත වාර්තා කල හැකිය. පුද්ගලයෙකු හට සිදුවුණු අලාභහානියක් සම්බන්ධයෙන් වාර්තාවේ නිර්දේශයක් කිරීමට සභාපතිවරයාට හැකිය. වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල හැකිය.

- වෙනකට ලක්කිරීම සහ මානව හිමිකම් උල්ලංඝනය සම්බන්ධ සභාපතිවරයාගේ තීරණවලට උදාහරණ කොමිසමේ වෙබ් අඩවිය වන http://www.humanrights.gov.au/publications/reports-minister-under-ahrc-act වෙත පිවිසීමෙන් ලබාගත හැකිය.

## මා හට වැඩිදුර විස්තර ලබාගත හැක්කේ කොහෙන්ද?

ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම හා සම්බන්ධවීම සඳහා තොරතුරු:

**දුරකථන**
ජාතික තොරතුරු සේවාව: 1300 656 419
TTY: 1800 620 241
NRS: 133 677
ෆැක්ස්: (02) 9284 9611

ඔබට භාෂණ පරිවර්තකයෙකු අවශ්‍ය නම්, දුරකථන අංක 131 450 අමතා ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිසම (Australian Human Rights Commission) හා සම්බන්ධ කරදෙන ලෙස ඉල්ලා සිටින්න.

ඔබ බිහිරිනම් හෝ ශ්‍රව්‍ය ආබාධයක් ඇතිනම්, TTY දුරකථන අංක 1800 620 241 ඔස්සේ අප හා සම්බන්ධවිය හැකිය. ඔබ බිහිරිනම් හෝ දෘෂ්‍ය හෝ කථන ආබාධයක් ඇතිනම්, දුරකථන අංක 133 677 ජාතික රිලේ සේවාව (National Relay Service (NRS)) ඔස්සේද අප හා සම්බන්ධවිය හැකිය. ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍යනම් අපට එයද පිළියෙල කර දිය හැකිය.

ඔබ අන්ධනම් හෝ දෘෂ්ඨි ආබාධයක් ඇතිනම්, ඉල්ලා සිටි අවස්ථාවල වෙනස් ආකාරයකට තොරතුරු ලබාදිය හැකිය.

**තැපැල්**

GPO Box 5218
Sydney NSW 2001

**මාර්ගගත**
ඊමේල්: infoservice@humanrights.gov.au
වෙබ් අඩවිය: www.humanrights.gov.au

පහත වෙබ් අඩවිය වෙත යාම මගින් මාර්ගගතවද ඔබගේ පැමිණිල්ල යොමුකල හැකිය:
http://www.humanrights.gov.au/complaints/lodging-your-complaint.

**සාමාන්‍ය නීති උපදෙස්**

ඔබ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම්, නීති උපදෙස් ලබාගැනීමට සලකා බලනවා විය හැකිය. වෙනසකට ලක් කිරීම සහ අඩන්තේට්ටම් කිරී සම්බන්ධ නොමිළේ උපදෙස් ලබාදෙන ප්‍රජා නීති සේවා ඇත.

ඔබ විසින් නීති උපදේශක ආයතනයක් (https://www.nationallegalaid.org/for-individuals/) හෝ ඔබට සමීපම ප්‍රජා නීති මධ්‍යස්ථානය (www.naclc.org.au/directory) හා සම්බන්ධවිය හැකිය.

**වගකීමෙන් බැහැරවීම: මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු මාර්ගෝපදේශයක් වශයෙන් පමණක් ලබාදී ඇත. එය නිසි නීති උපදෙස්වලට ආදේශකයක් නොවේ.**